(86)

දෙපාර්තමේන්තු චක්‍රලේඛ 06/2023

මගේ අංකය: DAPH/AD/16/02/06
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
පේරාදෙණිය
2023.08.13

අධ්‍යක්ෂ (පරිපාලන/ සත්ත්ව සෞඛ්‍ය/ සත්ත්ව අභිජනන/ මානව සම්පත් සංවර්ධන/ පශු සැලසුම් හා ආර්ථික/ පශු අණ පනත් හා නීති/පශු පර්යේෂණ)
ප්‍රධාන ගණකාධිකාරී
ප්‍රධාන අභ්‍යන්තර විගණක
අංශ ප්‍රධානී (ඉංජිනේරු අංශය)
ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරී - අධ්‍යක්ෂ ජනරාල් කාර්යාලය

**<u>සියළු අංශ වල සිදුකරනු ලබන රාජකාරි හා සේවාවන් වල නිවැරදිභාවය හා විනිවිදභාවය ආරක්ෂා කර ගැනීම සඳහා ක්‍රමානුකූල ක්‍රමවේදයක් සකස් කිරීම</u>**

දෙපාර්තමේන්තුවේ පවතින සියළු අංශ වලින් සිදුකරනු ලබන රාජකාරි හා සේවාවන් වල නිවැරදිභාවය හා විනිවිදභාවය ආරක්ෂා කරගනිමින්, කාර්යක්ෂමතාවය ඉහල නැංවීම සඳහා සියළුම අංශ විසින් ක්‍රමානුකූල ක්‍රමවේදයක් සකස් කොට ක්‍රියාවට නැංවීම සඳහා මෙයින් උපදෙස් දෙනු ලැබේ.

02. ඒ අනුව සියළුම අංශ විසින් පහත සඳහන් ක්‍රමවේදය ඔස්සේ වැඩපිළිවෙළක් සකස් කොට ගත යුතු බව මෙයින් දන්වමි.

i. අංශය මගින් සිදු කරනු ලබන සෑම රාජකාරියක් සඳහාම සම්මත ක්‍රමවේදයක් (Standard Of Procedure) සකස් කිරීම හා එම ක්‍රමවේද අනුගමනය කරන බවට වගබලා ගැනීම.
ii. සියළුම කාර්යයන් සඳහා පිරික්සුම් ලැයිස්තුවක් (Check List) භාවිතා කිරීම.
iii. සියළුම කාර්යයන් පහත සඳහන් පරිදි අවම වශයෙන් නිලධාරීන් තිදෙනෙකුගේ/ පාර්ශව තුනකගේ සහභාගීත්වයෙන් හා වගකීමෙන් සිදුකිරීම.

| අනු අංකය | කාර්යය | වගකීම දරන නිලධාරියා |
|---|---|---|
| 1 | අදාල කාර්යය සඳහා පිරික්සුම් ලැයිස්තුව පරීක්ෂාව/ මූලික කටයුතු ඉටුකිරීම | විෂය භාර නිලධාරියා (පශු සම්පත් සංවර්ධන නිලධාරී/ සංවර්ධන නිලධාරී/ පර්යේෂණ සහකාර/ කළමනාකරණ සේවා නිලධාරී) |
| 2 | සම්මත ක්‍රමවේදයන් අනුව නිර්දේශ ලබාදීම | පශු වෛද්‍ය නිලධාරී/ පශු පර්යේෂණ නිලධාරී/ නියෝජ්‍ය අධ්‍යක්ෂ \| 25.v.3 |
| 3 | සම්මත ක්‍රමවේදයන් අනුව අනුමැතිය ලබාදීම | අධ්‍යක්ෂ/ ප්‍රධාන විද්‍යාඥ/ විශේෂඥ/ රෙජිස්ට්‍රාර්/ ප්‍රධාන ගණකාධිකාරී/ ප්‍රධාන අභ්‍යන්තර විගණක |
| 4 | සම්මත ක්‍රමවේදයන් අනුකූල නොවන අවස්ථා වලදී | අධ්‍යක්ෂකගේ නිරීක්ෂණ/ නිර්දේශ සහිතව විශේෂඥ කමිටුවකට හෝ සෘජුවම අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කිරීම |

03. ඒ අනුව සියළුම අංශ විසින් ඉහත සඳහන් ක්‍රමවේදය ඔස්සේ සකස් කරගන්නා ලද වැඩපිළිවෙළ 2023.09.01 දින සිට ක්‍රියාත්මක කල යුතු බවද මෙයින් දන්වමි.

ආචාර්ය කේ.ඒ.සී.එච්.ඒ. කොතලාවල
අධ්‍යක්ෂ ජනරාල්
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්

පිටපත් : 1. ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය - කා.දැ.ගැ.ස.
2. විගණකාධිපති - කා.දැ.ගැ.ස.

o/c
2023.08.08